2009.10.16 දින පළ වූ අංක 1,624 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.
මෙම සතියේ පළවන ගැසට් පත්‍රයේ V කොටසේ 2006 වර්ෂයේ ඔක්තෝබර්-දෙසැම්බර් කාර්තුවට අදාළව මුද්‍රණ ශිල්පීන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥාපනත යටතේ ලියාපදිංචි වූ පොත් නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පළ වේ.

03 NOV 2009

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,625 - 2009 ඔක්තෝබර් මස 23 වැනි සිකුරාදා - 2009.10.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| [illegible] පත්කිරීම් ... ... ... ... | — |

| | පිටුව |
|---|---|
| පළාත් සභා නිවේදන ... ... ... ... | 1650 |
| පළාත් සභා විවිධ දැන්වීම් ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |


සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා භාරගන්නා සියළුම දැන්වීම් ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, ආයතන සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට නෙමසකට පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2009 ඔක්තෝබර් මස 30 වැනි දින පළ කරන ගැසට් පත්‍රයේ දැන්වීම් 2009 ඔක්තෝබර් මස 16 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

ලක්ෂමන් ගුණවර්ධන,
රජයේ මුද්‍රණාලයාධිපති.

2009 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

049 - B 080061— 7,100 (2009/10)

# පළාත් සභා නිවේදන

## සබරගමුව පළාත

## 2009 අංක 02 දරන සබරගමු පළාතේ පළාත් සභාවේ සංවර්ධන නිර්මාණ සහ යන්ත්‍රෝපකරණ අධිකාරියක් පිහිටුවීම පිළිබඳ ප්‍රඥප්තිය

සබරගමුව පළාත තුළ මාර්ග සහ වෙනත් ඉදිකිරීම් ක්‍රියාත්මක කිරීම සඳහාත්, යන්ත්‍රෝපකරණ වාහන අළුත්වැඩියා කිරීම, කුලියට දීම, වාහන පැදවීම පුරුදු කිරීම හා වාහන යෝග්‍යතා සහතික නිකුත් කිරීම සඳහාත්, ඊ සම්බන්ධයෙන් හෝ ඊට ආනුෂංගික කරුණු සඳහාත්, සබරගමු පළාතේ පළාත් සභාවේ සංවර්ධන නිර්මාණ සහ යන්ත්‍රෝපකරණ අධිකාරියක් පිහිටුවීම සඳහාත් වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සබරගමු පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය

1. මෙම ප්‍රඥප්තිය සබරගමුව පළාතේ පළාත් සභාවේ 2009 අංක 02 දරන සංවර්ධන නිර්මාණ සහ යන්ත්‍රෝපකරණ අධිකාරිය පිහිටුවීම පිළිබඳ ප්‍රඥප්තිය ලෙස හඳුන්වනු ලබන අතර, එය ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලද දින සිට ක්‍රියාත්මක වන්නේ ය.

### I කොටස

සබරගමුව පළාතේ සංවර්ධන නිර්මාණ සහ යන්ත්‍රෝපකරණ අධිකාරිය පිහිටුවීම.

අධිකාරිය සංස්ථාගත කිරීම

2. (1) මෙහි මින් මතු "අධිකාරිය" යනුවෙන් හඳුන්වනු ලබන සබරගමුව පළාතේ සංවර්ධන නිර්මාණ සහ යන්ත්‍රෝපකරණ අධිකාරියක් මෙයින් පිහිටුවනු ලැබේ.

(2) අධිකාරිය (1) උප වගන්තියෙන් ඊට දී ඇති නාමයෙන්, සංස්ථාවක් විය යුතු අතර, එයට අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතුය. අධිකාරිය විසින් ද, අධිකාරියට විරුද්ධව ද, අධිකාරිය නාමයෙන් නඩු පවරනු ලැබිය හැකි විය යුතු ය.

අධිකාරියේ සංයුතිය

(3) (1) *(අ)* අධිකාරිය, අධ්‍යක්ෂ මණ්ඩලයකින් සමන්විත වන සාමාජිකයන් හත් දෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර එයින් තිදෙනෙකු නිල බලැති සාමාජිකයන් ද, සිව් දෙනෙකු පත් කළ සාමාජිකයන් ද විය යුතුය.

*(ආ)* අධිකාරියේ සියලු සාමාජිකයන් අමාත්‍යවරයාගේ අත්සනින් යුක්තව නිකුත් කරනු ලබන ලිපියක් මගින් විධිමත්ව පත් කරනු ලැබිය යුතු වන්නේ ය. එවැනි සියලු පත්වීම් *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුත්තේ ය.

*(ඇ)* නිල බලයෙන් පත් කරනු ලබන අධිකාරියේ සාමාජිකයන් පහත සඳහන් අය විය යුතුය -

(i) විෂය භාර පළාත් අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ යෝග්‍ය යැයි ලේකම්වරයා සලකන්නේ නම් තමා වෙනුවට එකී ලේකම්වරයා විසින් පත් කරනු ලබන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු,

(ii) විෂය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ ඉංජිනේරුවරයෙකු සහ,

(iii) විෂය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ ගණකාධිකාරීවරයෙකු.

*(ඈ)* පත් කල සාමාජිකයන් ප්‍රවාහනය, ආර්ථික විද්‍යාව, පරිපාලනය හෝ ඉංජිනේරු විද්‍යාව යන ක්ෂේත්‍රවලින් එකක හෝ වැඩි ගණනක පුළුල් පලපුරුද්දක්, සුදුසුකම් හෝ හැකියාවක් දක්වා ඇත්තා වූ ඔවට අමාත්‍යවරයා පැහීමකට පත්වන පුද්ගලයන් සිව්දෙනෙකුගෙන් සමන්විත වන්නේ ය.

(2) ඉහත සඳහන් පත් කළ සමාජිකයින් අතුරින් එක් අයෙකු, අධිකාරියේ සභාපති ලෙස අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන්නේ ය.

(3) ඉහත 3(1).(ඇ).(i) උපවගන්තියේ සඳහන් විෂය භාර පළාත් අමාත්‍යාංශයේ ලේකම්වරයා යන්නට, තත්කාලයේ එම ධුරයට විධිමත් පරිදි පත් කරනු ලැබ සිටින නිලධාරියෙකු මෙන්ම, එම ධුරයේ වැඩ බැලීමට හෝ පත් කර ඇති නිලධාරියෙකු ද අදහස් වන්නේ ය.

(4) මෙම නියෝගයෙහි 3(1).(ඇ) උපවගන්තිය යටතේ පත් කරනු ලබන සාමාජිකයකුට විෂය භාර අමාත්‍යවරයා වෙත ලිඛිත දැන්වීමක් දීමෙන් ඔහුගේ ස්වකීය සාමාජිකත්වයෙන් ඉල්ලා අස්විය හැකි අතර, ඒ සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය ධුරය දැරීමට අමාත්‍යවරයා විසින් එකී විධි විධාන යටතට ගැනිය හැකි වෙනත් තැනැත්තෙකු පත් කරනු ලැබිය යුතුය.

(5) මරණය, ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීම නිසා කලින් ධුරය හිස් කළහොත් මිස, අධිකාරියේ සෑම සාමාජිකයෙකුම ඔහුගේ පත්වීමේ දින සිට අවුරුදු තුනක (03) කාලයක් ධුරය දැරිය යුතුය. තව ද, ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබ ඇත්නම් මිස, නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙකු විය යුතුය.

(6) අධිකාරියේ සාමාජිකයෙකු පත් කිරීම සම්බන්ධ යම් ආකාරයක දෝෂයක් පැවතීම හෝ පුරප්පාඩු පැවතීම අධිකාරියේ කටයුතු වලට බාධාවක් නොවිය යුතුය.

(7) යම් හේතුවක් මත පුරප්පාඩු වන සාමාජිකයෙකු වෙනුවට වෙනත් තැනැත්තෙකු පත් කළ කල්හි, කලින් සාමාජිකත්වය දැරූ අයගේ නොගෙවී පවත්නා කාලය සඳහා පුරප්පාඩුවට පත් වන තැනැත්තා සාමාජිකත්වය දැරිය යුතුය.

## අධිකාරියේ බලතල

5. (1) අධිකාරිය විසින් තීරණය කරනු ලැබිය යුතු යැයි මෙම ප්‍රඥප්තියෙන් බලය දී ඇති සියලු කාරනා සහ ප්‍රශ්න මෙම ප්‍රඥප්තියේ විධි විධාන වලට අනුකූලව පවත්වනු ලබන අධිකාරියෙහි රැස්වීමකට පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතරය තීරණය කරනු ලැබිය යුතුය. අධිකාරියෙහි බලතල බහුතරය සතු විය යුතු බව

(2) අධිකාරියෙහි යම් රැස්වීමක් සඳහා වූ ගණ පූර්ණය සාමාජිකයන් තුන් දෙනෙකු (03) විය යුතුය. ගණ පූර්ණය

(3) අධිකාරියේ සාමාජිකයන්ගේ පුරප්පාඩුවක් තිබිය දී වුව ද, අධිකාරියට ක්‍රියා කළ හැකිය. අධිකාරියේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබීම හෝ එහි සාමාජිකයෙකු පත් කිරීමෙහි හෝ නම් කිරීමෙහි ලා හෝ යම් දෝෂයක් තිබීම පමණක් හේතු කොට ගෙන අධිකාරියෙහි යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් අවලංගු වීම හෝ අවලංගු වූ සේ සලකනු ලැබීම සිදු නොවිය යුතුය.

(4) අධිකාරිය විසින්, අධිකාරියට අධ්‍යක්ෂවරයෙකු පත් කරනු ලැබිය යුතුය. ඔහු අධිකාරියේ ලේකම්වරයා ද විය යුතුය. විධායක අධ්‍යක්ෂ
එම අධ්‍යක්ෂවරයාට අධිකාරියේ රැස්වීම්වලට පැමිණ සිටීමේ අයිතිය ද, එහි කථා කිරීමේ හා අදහස් දැක්වීමේ අයිතිය ද තිබිය යුතුය. එහෙත්, අධිකාරියේ කටයුතු සඳහා ඡන්දය දීමේ අයිතිය ඔහුට නොතිබිය යුතුය.

(5) ඉහත 4(4) උපවගන්තිය යටතේ පත් කරනු ලබන අධ්‍යක්ෂවරයා අධිකාරියේ ප්‍රධාන පරිපාලන බලධරයා විය යුතුය.

(5) (1) අධිකාරියෙහි මුද්‍රාව සභාපතිවරයා භාරයේ තිබිය යුතුය.

(2) අධිකාරියෙහි මුද්‍රාව අධිකාරිය විසින් තීරණය කරනු ලබන පරිදි විය යුතුය. අධිකාරියෙහි මුද්‍රාව

(3) අධිකාරියෙහි සාමාජිකයන් දෙදෙනෙකු ඉදිරිපිටදී හැර කිසිම සාධන පත්‍රයකට හෝ ලියවිල්ලකට අධිකාරියෙහි මුද්‍රාව නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් ඒ දෙදෙනා විසින් ඒ සාධන පත්‍රයට හෝ ලේඛනයට තම අත්සන් තැබිය යුතුය.

## 02 කොටස

## අධිකාරියේ අරමුණු

6. අධිකාරියේ අරමුණු පහත දැක්වෙන පරිදි වේ :- අධිකාරියේ අරමුණු

(අ) රජය විසින් සබරගමුව පළාත් සභාව වෙත පවරා දෙන ලද යන්ත්‍රෝපකරණ, උපකරණ, වාහන සහ අනෙක් සියලු චංචල්‍ය, නිශ්චලයන්, දේපළවල අයිතිය භාර ගැනීම හා පරිහරණය කිරීම ද මෙම ප්‍රඥප්තියේ කාර්යය සඳහා එකී දේපළ උපයෝගී කර ගැනීම ද ;

(ආ) අධිකාරිය සතු කරනු ලබන යන්ත්‍රෝපකරණ, උපකරණ, වාහන හෝ වෙනයම් කාර්මික උපකරණ කට්ටල අළුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම සහ අධිකාරිය සතු යන්ත්‍රෝපකරණ, උපකරණ, වාහන හෝ වෙනයම් කාර්මික උපකරණ කට්ටල අළුත්වැඩියා කිරීම, නඩත්තු කිරීම සහ සේවා කිරීම භාර ගැනීම සඳහා ද වැඩ පොලවල්, කර්මාන්ත ශාලා සහ ගරාජ් ඉදිකිරීම සහ නඩත්තු කිරීම සහ පවත්වා ගෙන යෑම ද ;

(ඇ) කර්මාන්ත සංවර්ධන ව්‍යාප්තිකරණය වැඩි දියුණු කිරීම ද, ගෙවී යන හෝ අපතේ යන ද්‍රව්‍යවලින් වැඩි උපයෝගීතාවයක් ලබා ගැනීම ද අරමුණු කර ගත් ක්‍රම සහ ක්‍රියා විධි සොයා ගැනීම ද කර්මාන්තයේ දී භාවිත කෙරෙන තාක්ෂණික

ක්‍රියාමාර්ග සහ ක්‍රම දියුණු කිරීම ද අභිමතාර්ථ කර ගත් යම් මදු ආකාරයක් අධිකාරියට යෝග්‍ය වේ යැයි හැඟේ නම්, එවැනි ආකාරයකින් අත්හදා බැලීම්, විශ්ලේෂණය කිරීම හා පර්යේෂණ කිරීම ද ;

(ඈ) සබරගමුව පළාතේ පළාත් සභාවට අයිති හෝ යම් රජයේ දෙපාර්තමේන්තුවක හෝ සංස්ථාවක හෝ පෞද්ගලික අංශයට හෝ අයිති බර යන්ත්‍රෝපකරණ, ද්‍රව්‍ය හෝ භාණ්ඩ ප්‍රවාහනය කිරීම ද ;

(ඉ) අධිකාරිය විසින් භාර ගන්නා ලද යම් කාර්යයක නිමාවේ ගුණාත්මක ප්‍රමිතිය සහතික කිරීම ද ;

(ඊ) පර්යේෂක සේවකයන්ගේ පුහුණු කටයුතු භාර සිටුවීම ද ;

(උ) කර්මාන්ත පර්යේෂණ කටයුතු සහ තාක්ෂණික පුහුණු කිරීම අභිවර්ධනය කිරීමට ආධාර කිරීම ද ;

(ඌ) කාර්මික සහ තාක්ෂණික දැනුම පිළිබඳ පුහුණු කිරීමේ කටයුතු ද ;

(එ) මෙම ප්‍රඥප්තියේ අභිමතාර්ථ සාක්ෂාත් කිරීමට අවශ්‍ය සියලු ක්‍රියා මාර්ග ගැනීම ද ;

යන කරුණු අධිකාරියේ අරමුණු විය යුතුය.

03 කොටස

## අධිකාරියේ බලතල හා කාර්යයන්

අධිකාරියේ බලතල හා කාර්යයන්

7. අධිකාරියෙහි බලතල හා කාර්යයන් පහත පරිදි විය යුතුය :

(1) සබරගමුව පළාතේ, පළාත් සභාවේ යම් සංවර්ධන වැඩසටහනක ඇතුලත් යම් නිර්මාණ කටයුත්තක් සම්බන්ධයෙන් ක්‍රමසම්පාදනය කිරීම, සැලසුම් කිරීම සහ එබඳු කටයුත්තක් කිරීම, උපදෙස් දීම හෝ තාක්ෂණ සහාය ලබාදීම ;

(2) යම් සංවර්ධන කටයුත්තක භෞතික පිහිටීම, අවශ්‍යතාව හෝ එකී සංවර්ධන කටයුත්ත පිහිටි ප්‍රදේශය හා පාරිසරික හිතකරතාවයද යන කරුණු සලකා බැලීමෙන් එකී කරුණුවල ඇති විශේෂ ගුණාගුණ මත පිහිටා, එවා විධිමත් විද්‍යාත්මක සිද්ධාන්ත හෝ ප්‍රායෝගික ශක්‍යතා සලකා බලා, අධිකාරිය වෙත ක්‍රියාත්මක කිරීම සඳහා භාර දෙන ලද සංවර්ධන කටයුත්තක් හෝ එබඳු සංවර්ධන කටයුත්තක කොටස් සම්බන්ධයෙන් පිළියෙල කරන ලද යම් සැලැස්මක් හෝ සැලසුම්කරණය පිළිබඳව තාක්ෂණික උපදෙස් ලබා දීම ;

(3) අධිකාරිය වෙත ක්‍රියාත්මක කිරීම සඳහා භාර දෙන ලද නිර්මාණ කටයුත්තක් පිළිබඳව ඇස්තමේන්තු පිළියෙල කිරීම හෝ ඇස්තමේන්තු පිළියෙල කරවීම ;

(4) අධිකාරිය වෙත ක්‍රියාත්මක කිරීම සඳහා භාර දෙන ලද යම් නිර්මාණ කටයුත්තක් පිළිබඳව පිළියෙල කරන ලද ඇස්තමේන්තුවක් ඌණ ඇගයීමකින් හෝ අධික ඇගයීමකින් යුක්ත වන බව අධිකාරියට පෙනී ගිය විට, එබඳු ඇස්තමේන්තුවක් සුපරීක්ෂාකාරීව වෙනස් කිරීම, සංශෝධනය කිරීම, පුනරීක්ෂණය කිරීම හෝ යළි අළුතින් ඇස්තමේන්තුවක් සකස් කිරීම ;

(5) අධිකාරිය විසින් භාර ගන්නා ලද යම් නිර්මාණ කටයුත්තක් හෝ යම් ව්‍යාපාර කටයුත්තක් පිළිබඳව වන අනුමත ඇස්තමේන්තු මුදල අධිකාරිය විසින් භාර ගන්නා ලද එබඳු කටයුත්තක් ඉටු කර, සම්පූර්ණ කිරීම වෙනුවෙන් අධිකාරියට අයවිය යුතු පිරිවැය ලෙස අය කර ගැනීම ;

(6) සියලු වර්ගවල ගොඩනැගිලි, කර්මාන්ත ශාලා, පට්ටල් අංගන සහ වෙනත් පහසුකම් හා ලෙනෙසිකම් තැනීමෙන්, පිහිටුවීමෙන්, මිළදී ගැනීමෙන් හෝ අන්‍ය විධියකින් සන්තකයට ගැනීම, අභිවෘද්ධිමත් කිරීම හා ක්‍රියාත්මකව පවත්වා ගැනීම ;

(7) අධිකාරියේ අභිමතාර්ථ මුදුන්පත් කර ගැනීමේ කාර්යය සඳහා අවශ්‍ය වී ඇත්තා වූ යන්ත්‍රෝපකරණ උපකරණ, නිර්මාණ හෝ යාන්ත්‍රික උපකරණ කට්ටල, වාහන, යන්ත්‍ර කොටස්, අමතර කොටස්, අන්‍ය සම්පත් යම් ලෙසකින් විස්තර කර ඇති දේපල සහ යම් දෙයක් හෝ ද්‍රව්‍යයක් මිළදී ගැනීම, පවරා ගැනීම, දීර්ඝ කාලීනව කුලියට ගැනීම, බද්දට ගැනීම හෝ මිල දී සන්තකයට ගැනීම ;

(8) සන්තකය අධිකාරිය වෙත මුළුමනින් හා ස්ථිර වශයෙන් පැවරී ඇත්තා වූ ද, අධිකාරියේ කාර්යය සඳහා උපයෝගී කර නොගත හැකි වන්නා වූ ද, යන්ත්‍රයක්, වාහනයක්, උපකරණයක්, අමතර කොටසක්, උපකරණ කට්ටලයක් හෝ වෙනයම් ද්‍රව්‍යයක්, හෝ දෙයක් අපහරණය කිරීම පිළිබඳ තීරණ ගැනීම ;

නිර්මාණ කටයුත්තක් යම් වර්ගයක යන්ත්‍රෝපකරණයක හා වාහනවල නඩත්තු කිරීමක් සහ අලුත්වැඩියා කිරීමක් සඳහා හෝ සම්බන්ධයෙන් කටයුතු කිරීම, භාර ගැනීම සහ කොන්ත්‍රාත්තු සහ ගිවිසුම්වලට බැඳීම සහ ඉටුකර දෙන ලද සේවය සඳහා ගාස්තු අයකිරීම් හෝ ලැබීම් ලබා ගැනීම ;

යම් යන්ත්‍රෝපකරණයක්, උපකරණයක්, උපකරණ කට්ටලයක් හෝ වාහනයක් දීර්ඝකාලීන කුලියට දීම, කෙටිකාලීන කුලියට දීම හෝ බද්දට දීම සහ ඊට ගාස්තු අය කිරීම, ලැබීම සහ වෙනත් ගෙවීම් ලබා ගැනීම ;

[illegible] හෝ වෙනත් නිර්මාණ කටයුතු වලදී උපයෝගී කර ගන්නා ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම සඳහා කර්මාන්ත පොළවල් පිහිටුවීමටත්, ගල් කඩන යන්ත්‍ර සවි කිරීමේ කාර්යය සඳහා අවශ්‍යවන කිනම් වර්ගයක හෝ ඉඩම් දේපළ හෝ කාර්යය ස්ථාන, බද්දට, දීර්ඝකාලීන කුලියට හෝ කෙටිකාලීන කුලියට ලබා ගැනීම ;

සබරගමුව පළාත තුළ කිසියම් ස්ථානයක යාන්ත්‍රික කම්හල් පිහිටුවීමට, එබඳු කම්හල් පිහිටුවීමට ඉඩකඩ ලබාගැනීමට සහ එබඳු කම්හල් පවත්වා ගෙන යාමට අවශ්‍යවන්නා වූත්, ප්‍රයෝජන වන්නා වූත්, ඉඩම් ගොඩනැගිලි, කාර්යාල භූමි, අංගන සහ සෑම වර්ගයකම දේපල, තැනීම්, උපකරණ සහ කුමන ආකාරයේ හෝ දෙයක් මිළදී ගැනීම හෝ අන් ආකාරයකින් බද්දට ගැනීමෙන් අත්පත් කර ගැනීම, නිර්මාණය කිරීම, අභිවෘද්ධිමත් කිරීම සහ උපයෝගී කර ගැනීම ;

යම් අවශ්‍ය යන්ත්‍ර කට්ටලයක් ක්‍රියාත්මක කිරීමට හා නඩත්තු කිරීමට ද, යන්ත්‍රෝපකරණ සහ වාහන අලුත්වැඩියා කිරීමේ ව්‍යවසාය කරගෙන යාමට ද අවශ්‍ය වන්නා වූ කිසියම් ඝන ද්‍රව්‍යයක්, ද්‍රවයක්, ඉමල්ෂන් ද්‍රව්‍යයක්, ලිහිසි තෙල්, ඉන්ධන තෙල්, වායු හා වෙනයම් ද්‍රව්‍යයක් ද ගොඩනැගිලි ඉඩම් උපකරණ, මෙවලම් සහ සේවා වඩුන ඉදි කිරීම් ඇතුළු උපකරණ ද මිළ දී ගැනීම බද්දට ගැනීම සහ පවරා ගැනීමෙන් අත්පත් කර ගැනීම ;

අධිකාරියට බලපාන සියලු ආකාරයේ පාඩු, හානි අනතුරු අවදානයම් සහ ණය බැරකම් ආවරණයක වන සේ කිසියම් සමාගමක් හෝ පුද්ගලයෙකු සමඟ රක්ෂණ ගිවිසුම්වලට ඇතුළු වීම ;

ජලය, විදුලිය, වායු, ඉන්ධන තෙල්, යන්ත්‍ර කොටස් සහ වෙනත් සේවා පහසුකම් සපයා ගැනීම සඳහා පෞද්ගලික අංශය ඇතුළු යම් සංවිධානයක් සමඟ කොන්ත්‍රාත්තු ඇති කිරීම සහ ගිවිසුම්වලට ඇතුළු වීම ;

අධිකාරිය පිහිටුවීම අනුදන්නා ලද දිනයේ සිට ගණන් ගනු ලබන වාර්ෂික සමාන වාරික මඟින් අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරනු ලබන කාලයක් තුළ දී නිම කළ යුතු පොලියෙන් නිදහස් කරන ලද ණය පදනමක් මත අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතිව අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන සාමූහික මූල්‍ය ප්‍රතිපාදනයක් ආරම්භක ප්‍රාග්ධනය ලෙස ලබා ගැනීම සහ එකී ප්‍රාග්ධනයෙන් වැය දැරීම ;

අධිකාරිය විසින් ඉටු කරන ලද කටයුත්තක් හෝ සේවයක් වෙනුවෙන්, එකී කටයුත්ත හෝ සේවය සඳහා ගෙවිය යුතු බවට අධිකාරිය විසින් අනුමත කරන ලද ඇස්තමේන්තු මුදල අය විය යුතු ගෙවීම් ලෙස අය කිරීම සහ ලබා ගැනීම.

යම් කටයුත්තක් හෝ සේවයක් පිළිබඳව අනුමත වූ ඇස්තමේන්තුවකින් වැය නොවී ඉතිරි වන යම් මුදලක් තිබේනම්, එබඳු මුදල අධිකාරිය විසින් නීත්‍යානුකූලව උපයන ලද මුදලක් සේ ලාභයක් වශයෙන් එක් රැස්විය යුතුය ;

[illegible] ක්ෂය වීම, වෙන් කළ මුදල්, රක්ෂණ වාරික, ණය පියවීම හෝ අධිකාරියේ යහපතට උපස්ථම්භක වන වෙනයම් කාර්යයක් සඳහා මුදල් ලබා ගැනීම සඳහා අරමුදලක් ඇති කිරීම ;

[illegible] වන්දි, ප්‍රදාන, දායකවීම් හෝ අන් ආකාරයකින් ද, ජාතික රාජ්‍යමය, අධ්‍යාපනික, සංස්කෘතික, පුණ්‍ය, සුභ සාධන, ආගමික, අභිමතාර්ථ සඳහා ද අධිකාරිය යෝග්‍ය යැයි සලකන ආයතන සඳහා ද අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව, මුදලින් හෝ අන්‍යාකාරයකින් ප්‍රදානයන් කිරීම ;

චෙක්පත්, බැංකු අණකර, ණයකර, මුදල් ඇනවුම් හෝ මුදල් අණකර භාර ගැනීම, පිටසන් කිරීම හෝ ගනු දෙනු කිරීම;

අධිකාරියේ පරමාර්ථයන්ට අදාල ගිවිසුම්වලට ඇතුල් වීම ;

අධිකාරිය විසින් සපයනු ලබන සේවා සඳහා ගාස්තු අය කිරීම ;

යම් නිශ්චල හෝ චංචල දේපලක් අත් කර ගැනීම, දැරීම, බද්දට හෝ කුලියට දීම, උකස් කිරීම, [illegible] කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයෙකින් බැහැර කිරීම ;

අධිකාරියට උපදෙස් දීම පිණිස පත්කරගත යුතු උපදේශක සභාවක සංයුතිය හා එහි ක්‍රියා පටිපාටීන් පිළිබඳ තීරණ ගැනීම ;

අධිකාරියේ කාර්ය මණ්ඩලය, පරිපාලනය ගැන අවශ්‍ය කාර්ය පටිපාටීන් සම්මත කිරීම හා ක්‍රියාත්මක කිරීම.

## 04 කොටස

### අධිකාරියට පත්වීම් ලැබිය නොහැකි පුද්ගලයන්

අධිකාරියට පත්වීමට නොහැකි පුද්ගලයින්

8. (1) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයෙකු ලෙස ක්‍රියා කරන කවර පුද්ගලයෙකු වුව ද, අධිකාරියෙහි සාමාජිකයෙකු ලෙස පත් නොකරනු ලැබිය යුතු වන්නේ ය.

(2) විකල් සිහියෙන් යුත් පුද්ගලයෙකු හෝ බංකොලොත් හෝ වස්තු භංගත්වයට පත් වූවකු බවට ප්‍රකාශයට පත් කරන ලද පුද්ගලයෙකු හෝ කවර අන්දමකින් හෝ විස්තර කෙරෙන සිර දඬුවමකට යටත් කළ හැකි, වරදක් කරන ලද බවට අධිකරණ විසින් විනිශ්චය කරනු ලැබූ පුද්ගලයෙකු අධිකාරියෙහි සාමාජිකයෙකු ලෙස පත් නොකරනු ලැබිය යුත්තේ ය.

(3) මහජන ඡන්දයෙන් තේරී පත් වූ පළාත් පාලන ආයතනයක මහජන නියෝජිතයෙකු වන යම් පුද්ගලයෙකු, අධිකාරියෙහි සාමාජිකයෙකු ලෙස පත් කරනු ලැබීමට සුදුසුකම් නොලබන්නේ ය.

9. රජයේ තනතුරක් දරන යම් පුද්ගලයෙකු සමගාමීව අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස පත් කරනු ලැබීමට ඔහු විසින් එබඳු තනතුරක් දරනු ලැබීම නුසුදුසුකමක් නොවිය යුත්තේ ය.

## 05 කොටස

### උපදේශක සභා

උපදේශක සභා පත් කිරීම.

10. (1) මෙම ප්‍රඥප්තියේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ හා විධි විධාන බල ගැන්වීමේ කාර්යය සඳහා අවශ්‍ය යයි අමාත්‍යවරයා සලකන යම් කරුණක් හෝ සියළු කාරණා සම්බන්ධයෙන් අධිකාරියට උපදෙස් දීම සඳහා අධිකාරියෙන් විෂය අමාත්‍යවරයා විසින් උපදේශක සභාවක් පිහිටුවනු ලැබිය හැකිය.

(2) උපදේශක සභාව අධිකාරිය විසින් තීරණය කරනු ලබන යම් සාමාජිකයන් සංඛ්‍යාවකින් සමන්විත විය යුතු අතර, අධිකාරිය තීරණය කරනු ලබන හා ක්‍රියා කරනු ලබන කොන්දේසි මත පත් කරනු ලැබීම සිදු කළ යුතුය.

(3) උපදේශක සභා රැස්වීම්වල ගණපූර්ණය සඳහා අවශ්‍ය සාමාජික සංඛ්‍යාව තීරණය කිරීමේ බලය ද ඇතුළුව, එකී කාර්ය පටිපාටිය නියම කිරීමේ හා විධිමත් කිරීමේ බලය ද අධිකාරිය සතු වන්නේ ය.

(4) උපදේශක සභා සෑම සාමාජිකයෙකුම විසින් ඔහු කලින් ඉල්ලා අස්වුවහොත්, මියගියහොත් හෝ ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ මිස පත් කරන ලද දින සිට අවුරුදු 03ක් ධූරය දැරිය යුතුය.

(5) ඉල්ලා අස් වන බවට අධිකාරියෙහි සභාපති වෙත ලිපියක් යැවීමෙන් උපදේශක සභාවේ යම් සාමාජිකයෙකුට ධූරයෙන් ඉල්ලා අස්විය හැකිය.

(6) ඉල්ලා අස්වීමෙන් හෝ ස්වකීය ධූර කාලය ඉකුත් වීමෙන් හෝ ස්වකීය ධූරය හිස් කරන සාමාජිකයෙකු නැවත පත් කරනු ලැබීම සඳහා සුදුස්සෙකු විය යුතුය.

(7) උපදේශක සභාවක යම් සමාජිකයෙකු ඉවත් කිරීම යෝග්‍ය යයි අධිකාරිය සලකන හොත් අධිකාරිය විසින් ඒ බව අමාත්‍යවරයා වෙත වාර්තා කිරීමෙන් පසු අමාත්‍යවරයා විසින් එකී සාමාජිකයා සාමාජිකත්වයෙන් ඉවත් කරනු ලැබිය හැකිය.

## 06 කොටස

### අධිකාරියේ කාර්යය මණ්ඩලය

අධිකාරියේ කාර්ය මණ්ඩලය

11. (1) අධිකාරියේ අවශ්‍ය වේ යැයි සලකනු ලබන යම් සේවකයින් අධිකාරියේ කාර්යය මණ්ඩලය ලෙස පත් කරනු ලැබීමට අධිකාරියට හැකි වේ.

(2) එබඳු කාර්යය මණ්ඩලය පත් කිරීමට ද, සේවයෙන් පහ කිරීමට ද, විනය කටයුතු පාලනය කිරීමට ද සහ වැටුප්තල නියම කිරීමට ද, වැටුප් හෝ වෙනත් දීමනා නියම කිරීමට ද, එපරිදි ගෙවීම් කිරීමට ද කොන්දේසි හා ප්‍රතිඥා නිකුත් කිරීමට ද, කාර්ය පටිපාටීන් නියම කිරීම අධිකාරිය තීරණය කරන පරිදි විය යුතුය.

(3) අධිකාරියට පත් කරනු ලබන සේවකයන් සඳහා සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල යටතේ දායක මුදල් ගෙවිය යුතු අතර, ඒ යටතේ වන ප්‍රතිලාභවලට එම සේවකයන්ට හිමිකම් ලැබිය යුතුය.

රජයේ නිලධාරීන් අධිකාරියට පත් කරනු ලැබීම

[illegible] (1) යම් රාජ්‍ය නිලධාරියෙක් ඔහුගේ කැමත්ත ලබා ගැනීමෙන් පසු අධිකාරියේ කාර්යය මණ්ඩලයට පත් කරනු ලැබිය හැකි වන්නේ ය.

(2) (i) රාජ්‍ය නිලධාරියෙකු අධිකාරියේ කාර්යය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලබන කල්හි, රාජ්‍ය කාර්මික සංස්ථා ආඥාපනතේ 26 වන වගන්තියේ 4(ඒ) උපවගන්තිය අත්හැර, උප වගන්ති (3) සහ (5) සුදුසු වෙනස් කිරීම් සහිතව එබඳු නිලධාරියෙකු සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

(ii) රාජ්‍ය නිලධාරියෙකු අධිකාරියේ කාර්යය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලබන කල්හි, රාජ්‍ය කාර්මික සංස්ථා ආඥාපනතේ 26 වැනි වගන්තියේ 3 (ඒ) උප වගන්තිය අත්හැර, උපවගන්ති (4) සහ (5) සුදුසු වෙනස් කිරීම් සහිත එබඳු නිලධාරියෙකු සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

07 කොටස

මුදල්

[illegible] (1) අධිකාරියට අධිකාරියේ නමින් අරමුදලක් විය යුතුය. අධිකාරියේ අරමුදල

(2) (i) අධිකාරියේ ප්‍රයෝජනය සඳහා පළාත් සභාව විසින් කලින් කල සම්මත කරනු ලබන සියලුම මුදල්

(ii) අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා කාර්ය හා කර්තව්‍ය ඉටුකිරීමෙහි ලා අධිකාරියට ලැබිය හැකි සියලුම මුදල්.

(iii) අධිකාරියෙහි බැරට උපචිත වන්නා වූ සියලුම මුදල් අධිකාරියෙහි අරමුදලට බැර කරනු ලැබිය යුතුය.

(3) අධිකාරියට ලැබී, අධිකාරියේ අරමුදලට ගෙවනු ලැබිය යුතු සියලුම මුදල් ආණ්ඩුකාරතුමා අනුමත කළ රාජ්‍ය අංශයේ බැංකුවක තැන්පත් කළ යුතුය.

[illegible] (1) අධිකාරියේ කටයුතු කළමනාකරණය කිරීමේ දී ද, අධිකාරියේ සාමාජිකයන්ට සහ අධිකාරියේ සේවා නියුක්තයන්ට පාරිශ්‍රමික ගෙවීමේ දී ද, මේ ප්‍රඥප්තිය යටතේ අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීමේ දී ද අධිකාරිය විසින් දරන ලද යම් වියදමක් පියවීමේ කාර්ය සඳහා සහ අධිකාරිය විසින් කලින් කල බලය දෙනු ලබන වෙනත් යම් කාර්ය සඳහා අධිකාරිය විසින් ගෙවනු ලැබිය හැකිය.

(2) අධිකාරියෙහි අරමුදලින් කරනු ලබන සියලු ගෙවීම් සඳහා වූ චෙක්පත් හෝ අණකර අධිකාරිය විසින් ඒ සඳහා බලය පවරනු ලැබූ දෙදෙනෙකු විසින් අත්සන් කල යුතුය.

[illegible] (1) අධිකාරියෙහි මුදල් වර්ෂය ලින් වර්ෂය විය යුතුය. අයවැය ලේඛන

(2) අධිකාරියෙහි සභාපතිවරයා විසින් එක් වර්ෂයක දී, රීති මගින් නියම කරනු ලැබ ඇති දිනයක දී හෝ ඊට පෙර එම රීති වල දක්වා ඇති ආකෘතිය අනුව, ඊළඟ වර්ෂය සඳහා ඇස්තමේන්තුවක් එම වර්ෂයේ දී ලබාගත හැකි ආදායම් හා යෝජිත වියදම් පිළිබඳ විස්තර ඇතුළත්ව පිළියෙල කොට, අධිකාරිය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

(3) එම ඇස්තමේන්තුව අදාළ වන වර්ෂය ආරම්භ වීමට පෙර අධිකාරිය විසින්ම එහි යම් සංශෝධන කිසිවක් තිබේ නම්, ඒවාද සමග අවසාන වශයෙන් සැළකිල්ලට භාජනය කොට සම්මත කරනු ලැබිය යුතුය.

(4) අධිකාරියේ සභාපතිවරයා විසින් අවශ්‍ය නම් කවර හෝ අවස්ථාවක දී අතිරේක ඇස්තමේන්තුවක් පිළියෙල කොට අධිකාරියට ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

(5) යම් ඇස්තමේන්තුවක් හෝ අතිරේක ඇස්තමේන්තුවක අඩංගු සියලු විෂයයන්ට නැතහොත් ඉන් කිසිවක් සම්මත කිරීම, වෙනස් කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම නැතහොත් යම් විෂයක් එකතු කිරීම අධිකාරිය විසින් කරනු ලැබිය යුතුය.

[illegible] (1) අධිකාරියෙහි ආදායම් සහ වියදම්, වත්කම් හා බැරකම් සහ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳ රීති මගින් නියම කරනු ලබන නිසි ගිණුම් පොත් තබා ගැනීමට සැලැස්විය යුතුය. අධිකාරියේ ගිණුම්

(2) සෑම මුදල් වර්ෂයක් සම්බන්ධයෙන් ආදායම්, වියදම් ගිණුම හා ශේෂ පත්‍රය අනුගාමී වර්ෂයේ මාර්තු 15 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

ගිණුම් විගණනය

17. (1) අධිකාරියෙහි ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වැනි ව්‍යවස්ථාවේ විධිවිධාන අදාළ විය යුතුය.

(2) අදාළ ගිණුම් විගණනයේ දී 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ද අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතුය.

(3) (අ) 17(1) සඳහන් පරිදි යම් වර්ෂයක් සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ වාර්තාව ලැබුණු විගස එම කරුණුවලට අදාළව පැහැදිලි කිරීම පරිපාලනය කිරීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාවක් පහත දැක්වෙන ලේඛන සමඟ අමාත්‍යවරයා වෙත, අධිකාරිය විසින් ඉදිරිපත් කිරීමට සැලැස්විය යුතුය -

(i) විගණකාධිපතිවරයාගේ වාර්තාව ;
(ii) ශේෂ පත්‍රය ; සහ
(iii) ලාභ අලාභ ගිණුම.

(3) (ආ) (අ) ඡේදය යටතේ තමා වෙත එවන ලද පූර්වගාමී වර්ෂයේ ගිණුම් පිළිබඳ විගණකාධිපති වාර්තාව අමාත්‍යවරයා විසින් අනුගාමී වර්ෂයේ මාර්තු 31 දිනට පෙර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

පොදු විධි විධාන

අමාත්‍යවරයා සතු බලතල

18. (1) අමාත්‍යවරයාගේ ආඥාවකින් පත් කර නියම කරනු ලබන ඒක පුද්ගල හෝ බහු පුද්ගල පරීක්ෂණ මණ්ඩලයක් විසින් අධිකාරියේ යම් කර්තව්‍යයක් හෝ සියලු කාර්යයන් පිළිබඳව පරීක්ෂා කොට, වාර්තා කිරීමට ආඥාවක් නිකුත් කිරීමට අමාත්‍යවරයාට හැකි විය යුතු අතර, එබඳු ආඥාවක් නිකුත් කර ඇති කල්හි, අධිකාරිය විසින් එකී ආඥාව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සියලු පහසුකම් සලසා දිය යුතු වන්නේ ය.

(2) අධිකාරියේ වත්කම්, දේපළ, ව්‍යවසායක කටයුතු සහ මුදල් පිළිබඳ විස්තර තොරතුරු ද අය වැය, ලාභාලාභ හා ගණන් හිලව් පිළිබඳ විස්තර ද යම් අවශ්‍ය ආකෘතියක ස්වරූපයෙන් තමා වෙත සපයන ලෙසට අමාත්‍යවරයා විසින් කලින් කලට නියම කළ හැකි අතර, අධිකාරිය විසින් එබඳු නියම කිරීමක් පිළිපැදිය යුතුය.

රීති සෑදීම සඳහා බලය

19. (1) මෙම ප්‍රඥප්තිය ප්‍රතිපත්ති හා විධි විධාන ක්‍රියාවට නැගීම හෝ බල ගැන්වීම සඳහා අමාත්‍යවරයා විසින් රීති පනවනු ලැබිය හැකිය.

(2) 1 වැනි උප වගන්තිය යටතේ සම්පාදනය කෙරෙන සෑම රීතියක්ම ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කළ යුතු වන අතර, එබඳු ප්‍රසිද්ධ කළ දිනයේ සිට හෝ රීතියේ නියම කර තිබෙන දිනයේ සිට ක්‍රියාත්මක විය යුතු වන්නේ ය. තවද, එබඳු රීතිය මෙම ප්‍රඥප්තියේ ලා පැන වූ රීති ලෙසින් වලංගු සහ බල සහිත වන්නේ ය.

(3) සෑම රීතියක්ම ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කිරීමෙන් පසු, කඩිනමින් ලැබෙන පහසු අවස්ථාවේ දී අනුමැතිය සඳහා සභාවට ඉදිරිපත් කළ යුත්තේ ය. ගැසට් පත්‍රය පළ වී හය මාසයක් ඇවෑමෙන් වුව ද, යම් රීතියක් සභාවේ අනුමැතිය නොලබා තිබෙන විටෙක, එබඳු රීතියක් අහෝසි වූවා සේ සලකනු ලැබිය යුතු වුව ද, එබඳු රීති යටතේ ඉටුකරනු ලබන යම් කාර්යයන්ට එබඳු අහෝසි වීමක් බලනොපෑ යුතුය.

අධිකාරියෙහි සාමාජිකයන් සේවා නියුක්තයන් රජයේ සේවකයන් බව

20. (1) මෙම ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද අධිකාරියේ සියලු සාමාජිකයින්, නිලධාරීන් හා සේවකයින් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථකථනය තුළට පිළිගැනෙන රාජ්‍ය සේවකයින් ලෙස පිළිගනු ලැබිය යුතුය.

(2) යම් අධිකරණයක දී අධිකාරිය විසින් හෝ අධිකාරියට විරුද්ධව පැමිණිල්ලක් හෝ නඩුවක් ඉදිරිපත් කළ විට දැරිය යුතු අධිකරණමය වියදම් අධිකාරිය විසින් දැරිය යුතු අතර, එබඳු වියදම් අරමුදලින් හර කළ යුතු වන්නේ ය. එබඳු පැමිණිල්ලක දී හෝ නඩුවක දී අධිකාරිය විසින් ලබා ගන්නා ලද අධිකරණමය අයවීම් අරමුදලට බැර කළ යුතු වන්නේ ය.

(3) මෙම ප්‍රඥප්තිය යටතේ උද්දේශිත යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් සද්භාවයෙන් කරන ලද යම් ක්‍රියාවක් හෝ නොකර සිටීමක් වෙනුවෙන් අධිකාරියට හෝ අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයට හෝ අධිකාරියේ නිලධාරියෙකුට හෝ කිසිදු සේවකයෙකුට විරුද්ධව කිසිදු අධිකරණයක් හෝ විනිශ්චය අධිකාරියක් ඉදිරියේ නඩු පැවරිය නොහැකි විය යුතුය.

21. (1) අධිකාරියේ ප්‍රථම පත් කිරීමෙන් පසුව පිහිටුවනු ලබන අධිකාරියේ කාර්යාලය, කුරුවිට, පැරඩයිස් හි පිහිටි සබරගමු පළාත් සභාව යටතේ පාලනය වන දිසා යාන්ත්‍රික කම්හලට අයත් පරිශ්‍රයේ කටයුතු ආරම්භ කළ යුතුය.

(2) එම දිසා යාන්ත්‍රික කම්හලේ සේවය කරනු ලබන සේවකයන් අධිකාරියේ සේවකයන් ලෙස අන්තර්ග්‍රහණය කළ හැකිය.

(3) එසේ එම සේවකයන් අධිකාරියට අන්තර්ග්‍රහණය කිරීම පිළිබඳව අධිකාරිය විසින් පටිපාටි සකස් කළ යුතු අතර, එම පටිපාටි අමාත්‍යවරයා විසින් අනුමත කළහොත් පමණක් බලාත්මක විය යුතුය.

අධිකාරියෙහි සභාපති ද, අධ්‍යක්ෂ මණ්ඩලය ද, සියළුම නිලධරයන් ද, සේවකයන් ද, සම්බන්ධයෙන් පොදු දේපල පනතේ විධිවිධාන බල පවත්වනු ඇත.

මෙම ප්‍රඥප්තියෙහි සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල පාඨය බලපැවැත්විය යුතුය.

පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍යවුවහොත් මිස, මෙම ප්‍රඥප්තියෙහි,

"අධිකාරිය" - යනු, සබරගමුව පළාත් සභාවේ සංවර්ධන නිර්මාණ සහ යන්ත්‍රෝපකරණ අධිකාරිය ද,

"ආණ්ඩුකාරවරයා" - යනු, සබරගමුව පළාතේ ආණ්ඩුකාරවරයා ද,

"ගැසට් පත්‍රය" - යනු, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය ද,

"අමාත්‍යවරයා" - යනු, සබරගමුව පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා ද,

"ලේකම්" - යනු, ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම්වරයා ද,

...වෙන් අදහස් වන්නේ ය.

මෙම ප්‍රඥප්තිය 2009.09.24 වැනි දින පැවති සබරගමුව පළාතේ පළාත් සභාවේ සභා රැස්වීමේ දී සභා සම්මත වූ බවට ...තික කරමි.

අතුල කුමාර රාහුබද්ධ,
සභාපති,
සබරගමුව පළාතේ පළාත් සභාව.

...ම 2009ක් වූ සැප්තැම්බර් මස 30 වැනි දින,
...රගමුව පළාතේ පළාත් සභාවේ දී ය.

2009ක් වූ සැප්තැම්බර් මස 30 වැනි දින දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 154(ඇ) (3) වගන්තිය යටතේ ...මැතිය දෙමි.

ජානක බණ්ඩාර,
ආණ්ඩුකාරවර,
සබරගමුව පළාත.

10-694